සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## පෙරදිග සංගීතය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලදී දී ඇති පිළිතුරු හතරෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ස්වර පුවරුවක මධ්‍ය ස ස්වරයේ සිට උච්ච ස් ස්වරය දක්වා ගමන් කිරීමේදී හමුවන කලු යතුරු සංඛ්‍යාව,
   i 03 කි ii 04 කි iii 05 කි iv 06 කි

2. ස - ස - සරිගම, රි - රි - රිගමප ලෙස යෙදෙන ශුද්ධ ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර
   i ම - ම - මපධනි වේ
   ii ග - ග - ගමපධ වේ
   iii රි - රි - රිගපම වේ
   iv ග - ග - ගපමග වේ

3. සංගීතයේ දී "කාලය මනින මිම්ම" හඳුන්වන්නේ,
   i නාදය ලෙසයි ii ස්වර ලෙසයි iii තාලය ලෙසයි iv වේගය ලෙසයි

4. කෝලම් යනු
   i පහත රට ජන නාට්‍ය විශේෂයකි
   ii උඩරට ජන නාට්‍ය විශේෂයකි
   iii සබරගමු ජන නාට්‍ය විශේෂයකි
   iv නූර්තිවලට කියන තවත් නමකි

5. සුළු තනි තිත, මැදුම් තනි තිත, මහ තනි තිත යන තිත් රූප වලට සමානව මාත්‍රා විභාග වන හින්දුස්ථානී තාල රූප වන්නේ,
   i කෙහෙර්වා, ලාවණී, ජප් යන තාල රූපයි
   ii ලාවණී, දාදරා, ත්‍රිතාල යන තාල රූපයි
   iii දාදරා, ජප්, ත්‍රිතාල යන තාල රූපයි
   iv ත්‍රිතාල, දාදරා, කෙහෙර්වා යන තාල රූපයි

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා වරහන් තුළ දී ඇති වචන යොදා නිවැරදිව හිස්තැන් පුරවන්න.
  (ලය, චාල්ස් ඩයස්, දැල් ගී, ජෝන්ද සිල්වා, තිත් සහ තෙයි)

6. ධීවරයන් විසින් ගායනය කරනු ලබන සාමූහික ගීත විශේෂයක් ලෙස ............................... හඳුන්වාදිය හැකිය.
7. "විදුර" නූර්තියේ නිර්මාණ කරුවා ලෙස ..................................... සූරීන් හඳුන්වාදිය හැකිය.
8. තාලයේ වේගය ................................ ලෙස හඳුන්වයි.
9. "රාමායනය" නූර්තියේ නිර්මාණකරුවා ලෙස .......................................... සූරීන් හැඳින්විය හැකිය.
10. තාලම්පොටින් නිකුත්වන ධ්වනීන් ලෙස ............................................ නම් කළ හැකිය.

(2) WWW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!

• අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලදී දී ඇති ගීත පාදයට ගැලපෙන ගී වර්ගය තෝරා නිවැරදිව යාකරන්න.

11. "දම් වැසි වස්සන ලෝකේ" — A. රබන් ගී
12. "ගම්භිර කාලිංග නුවර" — B. නැලවිලි ගී
13. "උඩු තියරෙන් වැටී ගෙනේ" — C. ළමා ගී
14. "කටු අකුලේ මල් ඇහැරේ" — D. නූර්ති ගී
15. "සඳුන් කොකුම් මොරසුගාන" — E. කෝලම් ගී

• ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා කෙටි පිළිතුරු ලියන්න.

16. දේශීය සංගීත ප්‍රස්තාර කරණයේදී හමුවන ''ග්‍රහ'' අවස්තා කීයද?
17. සංගීතයේදී ලයෙහි ප්‍රභේද කීයක් භාවිතාවේද?
18. මාත්‍රා තුනෙන් තුන විභාග බෙදෙන දේශීය තිතෙහි නම ලියන්න.
19. ස්වර සප්තකය ලකුණු කිරීමේදී ස්වර සංඥා ලෙස තිතක් නොතබනුයේ කුමන සප්තකයට ද?
20. බටනලාවේ පිඹින සිදුර හැර, ස්වර වාදනය කරන සිදුරු කීයක් තිබේද?

(1 x 20 = ල. 20 යි)

## II කොටස

• පහත සඳහන් ප්‍රශ්න අතරින් ඔබ කැමති ඕනෑම ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

1. i දැල් ගී ගයන අවස්තාවක් ලියන්න (ල 2)
   ii දැල් ගී වල විශේෂ ලක්ෂණ 04ක් ලියන්න. (ල 4)
   iii කැමති දැල් ගීයක පදමාලාව ලියන්න. (ල 4)

2. පහත සඳහන් ගී පාදවලට අදාල ගී වර්ග පිළිබඳ කරුණු දෙක බැගින් ලියන්න.
   i දරු නැලවිලි ගී
   ii රබන් ගී
   iii දේශාභිමානී ගී
   iv උපදේශාත්මක ගී
   v ළමා ගී (2 x 5 = ල. 10 යි)

3. i "ත්‍රිවිධ සප්තකය" නම් කර එම සප්තකවලට අයත් ස්වර නිවැරදි ස්වර සංඥා යොදා ලියන්න.
   නම් කිරීමට (ල 3)
   සංඥා යොදා ලිවීමට (ල 3)

   ii සප්තකයේ ඇති අචල ස්වර දෙක ලියන්න (ල 1)
   iii මධ්‍ය ස ස්වරයේ සිට උච්ච සෘ ස්වරය දක්වා යෙදෙන ප්‍රකෘති විකෘති ස්වර 12 පිළිවෙළින් ලියන්න. (ල 3)

4. i ඔබ කැමති, කෝමල ග,නි ස්වර ඇතුළත් "ස්වර ස්ථාපන ගීතයක්" ගීත ස්වර ප්‍රස්තාරය කරන්න. (ල 6)
   ii කෝමල ග,නි ඇතුළත් ස්වර අභ්‍යාසයක් උච්ච සී දක්වා ගොඩනගන්න. (ල 4)

5. i කෝලම් නාට්‍ය පිළිබඳ විශේෂ ලක්ෂණ 04ක් ලියන්න. (ල 4)
   ii කෝලම් නාට්‍යවල එන චරිත දෙකක් නම් කරන්න. (ල 2)
   iii ඔබ කැමති කෝලම් ගීයක පද මාලාව ලියන්න. (ල 4)

PAST PAPERS WIKI
(2) WWW.PastPapers.WiKi (2)

Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 07 - 2023

# පෙරදිග සංගීතය - පිළිතුරු

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1. iii | 6. දැල් ගී | 11. D | 16. තුනකට |
| 2. ii | 7. චාල්ස් ඩයස් | 12. E | 17. තුනයි |
| 3. iii | 8. ලය | 13. B | 18. මැදුම් තනිතිත |
| 4. i | 9. ජෝන් ද සිල්වා | 14. C | 19. මධ්‍ය සප්තකය |
| 5. ii | 10. තිත් හා තෙයි | 15. A | 16. 06 යි |

1x20 = ල 20

## II කොටස

01. i දැල් අදින අවස්ථාව වැනි පිළිතුරක් (ල 2)

ii • නාද මාලා සරලය
- අර්ථ විරහිත පද යොදාගනී
- පිරිමින් විසින් ගයයි
- ඔරුව මුහුදට තල්ලුකිරීමේදී හා දැල ඇදීමේදී ගයයි
- මුහුදු රළවල රිද්මයට සමාන රිද්මයක් ඇත (ල 4)

iii දරුවා ලියා ඇති දැල් ගීතය සඳහා (ල 4)

02. i දරු නැලවිලි ගී
- සමාජ ගී ගනයට වැටේ
- නාදමාලා සරලය

ii රබන් ගී
- රබන් නර්තනයේදී යොදාගනී
- සරල මෙන්ම සංකීර්ණ නාදමාලා යොදාගනී

iii දේශාභිමානී ගී
- සරල මෙන්ම සංකීර්ණ නාදමාලා ඇත
- දේශයේ අභිමානය පිළිබඳව ලියැවී ඇත

iv උපදේශාත්මක ගී
- සිසුන්ගේ ආකල්ප හා චර්යාවන් වර්ධනයට ඉවහල්වන අයුරින් නිර්මාණය කර ඇත.
- සරල මෙන්ම සංකීර්ණ නාදමාලා ද ඇත.



(2) www.PastPapers.Wiki (1)
Download Term Test Papers, Short Notes From One Place!

iv ළමා ගී

- පදමාලා සරලයි
- ළමා මනසට ගැලපෙන නාදමාලාවන් ගෙන් යුක්ත වේ.

මෙවැනි ගැලපෙන කරුණු 2 බැගින් ලියා තිබෙන විට 2x5 = ල 10 යි

03. i මන්ද්‍ර, මධ්‍ය හා උච්ච සප්තක උදාහරණ සහිතව විස්තර කර තිබූ විට 2x3 = ල 6 යි

(උදාහරණයට ල 1 යි)

(විස්තර කිරීමට ල 1 යි)

ii ස,ප ස්වර

iii ස රි̲ රි ගු̲ ග ම ම́ ප ධ̲ ධ නි̲ නි ස් (ල 4)

04. i නිර්දේශිත කෝමල ග, නි සහිත ගීත වලින් එකක් ගීත ස්වර ප්‍රස්තාරය කර තිබූ විට (ල 6)

ii සරිගු̲

රිගු̲ම

ගු̲මප

මපධ̲

පධ̲නි̲

ධ̲නි̲ස් මෙවැනි ඕනෑම කෝමල ග,නි සහිත ස්වර අභ්‍යාසයක් ලියා තිබූ විට (ල 4)

05. i
- පහත රට බෙරය භාවිතා කරයි
- වෙස් මුහුණු භාවිතා කරයි
- හාස්‍ය රසය ජනිත කරවයි
- පහතරට ජන නාට්‍ය විශේෂයකි
- මෙවැනි ගැලපෙන කරුණු හතරක් ලියා ඇති විට (ල 4)

ii ජසයා
- ලෙංචිනා
- සබේ විදානේ මෙවැනි චරිත දෙකක් සඳහන් කර ඇති විට (ල 2)

iii ඔබ ඉගැන්වූ ඕනෑම කෝලම් ගීයක් ලියා ඇති විට (ල 4)

PAST PAPERS WIKI

(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**